1. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
3. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය
4. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම
5. ග්‍රාමීය විද්‍යුතනය
6. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම
7. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

### *II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්
2. ලංකා විදුලිබල සමාගම
3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
5. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
6. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
7. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

### *III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකා විදුලිබල පනත (2009 අංක 20)
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)
- බලශක්ති සංරක්ෂණ අරමුදල පනත (1985 අංක 2)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (11) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්වීතික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම සහ සම්පාදනය කිරීම

3. ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම

4. ජාතික පාසල් සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

5. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම

6. පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය

7. ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක විද්‍යාගාර ඇතුළු නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය

8. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ඉගෙනුම් උපකරණ සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. ජාතික අධ්‍යාපන ආයතනය
4. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
5. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
6. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
7. ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරිය
8. අධ්‍යාපන විද්‍යාපීඨ
9. ගුරු විද්‍යාල
10. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
11. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
12. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු විශ්වවිද්‍යාල
15. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලුම පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන
16. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
17. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
18. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
19. මහපොළ භාරකාර අරමුදල

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ආධාර ලබන පාසල් සහ අභ්‍යාස විද්‍යාල පනත (1960 අංක 5)
- අධ්‍යාපනික විද්‍යායතන පනත (1986 අංක 30)
- ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරිය පනත (1997 අංක 32)
- ජාතික අධ්‍යාපන ආයතන පනත (1985 අංක 28)
- රජයේ විභාග පනත (1968 අංක 25)
- පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 8)
- යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)
- රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)
- විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)
- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)

- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැතිව මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(11) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය *(සම්බන්ධිතයි)***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 9. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය | | |
| 10. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම | | |
| 11. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 12. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු | | |
| 13. ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම හා ධාරිතා සංවර්ධනය | | |
| 14. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 15. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය | | |
| 16. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම | | |
| 17. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම | | |
| 18. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම | | |
| 19. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්නායකයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(11) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය *(සම්බන්ධිතයි)***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 20. රැකියා වෙළෙඳපොළ ඉල්ලුමට ගැළපෙන උපාධිධාරීන් බිහිකිරීමට විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධනයන් සිදුකිරීම හා ඊට අවශ්‍ය මානව සම්පත් සැපයීමට සුදුසු පියවර ගැනීම | | |
| 21. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මගින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා සඳහා අන්තර්ජාතික පිළිගැනීම ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය කිරීම හා ප්‍රතීතනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 23. බෞද්ධ හා පාලි අධ්‍යයනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම | | |
| 24. තරුණ ප්‍රජාව වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම | | |
| 25. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 26. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (12) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. සමුද්‍ර, කිවුල් දිය(කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය
3. රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම
4. අනන්‍ය ආර්ථික කලාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරීම
5. ධීවර වරායවල් සහ නැංගුරම් පොළවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය
6. ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ වෙනත් යටිතල පහසුකම් පිහිටුවාලීම සහ ක්‍රියාත්මක කිරීම
7. ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම
8. ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම
9. මුහුදු මත්ස්‍ය වගාව ඇතුලු ජලජීවී වගා සංවර්ධනය සහ කළමනාකරණය
10. මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම
11. ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා එම ප්‍රතිඵල ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා යොදාගැනීමට අවශ්‍ය පියවර ගැනීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
2. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
3. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
4. සී/ස. සීනෝර් පදනම
5. ලංකා ධීවර සංස්ථාව
6. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය
7. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල
8. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල (මූල්‍ය)
9. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)
10. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
11. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
12. සීමාසහිත කිරියා/මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ලංකා (පෞද්ගලික) සමාගම
13. මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ලංකා සමාගම
14. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම
15. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23)
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53)
- ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54)
- ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)
- සත්ව රෝග පනත (1992 අංක 59)
- සත්ව ආහාර පනත(1986 අංක 15)
- සත්ව පනත (1958 අංක 29)
- පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(12) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය *(සම්බන්ධිතයි)***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 12. නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාළ පර්යේෂණ කටයුතු හා ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම | | |
| 13. ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | |
| 14. ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ග සංවර්ධනය | | |
| 15. ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු | | |
| 16. ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය | | |
| 17. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම | | |
| 18. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු | | |
| 19. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 20. නවීන තාක්ෂණය යොදාගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 21. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු | | |
| 22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 23. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (13) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන්හි අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම
3. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම
4. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්
5. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම
6. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම
7. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම
8. ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියට හා ජාත්‍යන්තර ඔලිම්පික් ප්‍රඥප්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම
9. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
2. දේශීය ණය සහ සංවර්ධන අරමුදල
3. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
5. පළාත් ක්‍රීඩා සංකීර්ණ
6. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
7. ජාතික ක්‍රීඩා සභාව
8. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
9. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- මහනගර සභා ආඥාපනත (1956 අංක 29) (52 අධිකාරිය)
- ප්‍රාදේශීය සභා පනත (1987 අංක 15)
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත (1999 අංක 31)
- නගර සභා ආඥාපනත (235 අධිකාරිය)
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)
- පළාත් සභා පනත (1987 අංක 42)
- පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)
- ක්‍රීඩා නීතිය (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරි පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(13) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 10. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර් ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 11. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම | | |
| 12. ජාතික ක්‍රීඩා සංගම් නියාමනය කිරීම | | |
| 13. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම | | |
| 14. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම | | |
| 15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (14) සංචාරක හා වනජීවී අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. සංචාරක හා වනජීවී විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම
3. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු
4. විවේකය ගතකිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම
5. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම
6. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශි කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු
7. වනජීවී සම්පත් සංරක්ෂණය
8. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම
9. වඳවී යාමේ තර්ජනයට මුහුණ පාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතියෙහි පාර්ශවකරුවන්ගේ 2019 සමුළුව (CITES) සම්බන්ධීකරණ හා ඊට අදාළ කටයුතු
10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
3. ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය
4. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
5. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
6. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
7. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8. වනජීවී භාරය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- සංචාරක පනත (2005 අංක 38)
- ජාතික සත්වෝද්‍යාන පනත (1982 අංක 41)
- උද්භිද උද්‍යාන ආඥාපනත (1928 අංක 31)
- වන සතුන් හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (1937 අංක 2)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (15) වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම<br><br>3. වාරිමාර්ග හා ජලාපවහන පද්ධති ඉදිකිරීම, ක්‍රමවත් නඩත්තුව මගින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සැපයුම ක්‍රමාණුකූලව ලබාදීම හා ජල ගැලීම් පාලන යෝජනා ක්‍රම තුළින් ජලාපවහන හා ගංවතුර පාලනය සිදුකිරීමට කටයුතු කිරීම<br><br>4. කෘෂිකාර්මික සංවර්ධනයට අවශ්‍ය වන වාරි පහසුකම් ප්‍රමාණවත් අයුරින් සැපයෙන පරිදි මනා ජල කළමනාකරණයක් පවත්වාගෙන යාම<br><br>5. ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි නිශ්චිත වශයෙන් නිර්ණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම<br><br>6. ජල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම<br><br>7. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>8. වේලි ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම<br><br>9. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම | 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>2. ජල සම්පත් මණ්ඩලය<br>3. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව<br>4. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>5. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය<br>6. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>7. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>8. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | ▪ වාරිමාර්ග ආඥාපනත (1946 අංක 22)<br><br>▪ ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29)<br><br>▪ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)<br><br>▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

## (15) වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. ගංගා, ඇල, දොළ, වැව් ආදී ජලමූලාශ්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම | | |
| 11. භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |
| 12. වැසි ජල සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 13. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු | | |
| 14. ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත් ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය | | |
| 15. ජාතික ප්‍රතිපත්ති මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම | | |
| 16. ව්‍යසන ලිහිල් කරලීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය | | |
| 17. ඉහත කාර්යභාරයන් නිසි වේලාවට ක්‍රියාත්මකවීම සහතික කරගැනීම පිණිස අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන හා නියෝජිතායතන, පුද්ගලික ආයතන, දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය | | |
| 18. පාරිසරික අවදානම්වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම | | |
| 19. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම | | |
| 20. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම | | |
| 21. ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම | | |
| 22. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (15) වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 23. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම<br>24. ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය<br>25. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>26. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

## (16) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය

| | | |
|---|---|---|
| 1. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම<br>3. රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම<br>4. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම<br>5. වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>6. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව<br>2. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය<br>3. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය<br>4. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>5. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය<br>6. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය හා අනුබද්ධ ආයතන<br>7. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය<br>8. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය<br>9. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)<br>10. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය<br>11. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව<br>12. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | ■ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)<br>■ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)<br>■ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)<br>■ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)<br>■ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)<br>■ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)<br>■ ජාතික මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (17) සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම
2. ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
3. විදේශීය රටවල් සමග සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම
4. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම් වූ සංචාරක වැඩ සටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
5. සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය හා මහා වංශය සම්පාදනය සඳහා අඛණ්ඩව අවශ්‍ය පියවර ගැනීම
6. ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
7. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
8. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
9. නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියා මාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
2. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
3. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
4. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
5. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
6. ටවර්හෝල් රඟහල පදනම
7. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
8. ජාතික කලා මණ්ඩලය
9. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
10. අපේ ගම
11. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
12. මධ්‍යම සංස්කෘතික අරමුදල
13. ජාතික චිත්‍රපටි සංස්ථාව
14. ගාලු උරුමය පදනම

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ(විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)
- ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)
- ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)
- සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)
- පුරාවස්තු ආඥාපනත (1940 අංක 9)
- ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)
- මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)
- රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)
- ගාලු උරුමය පදනම පනත (1994 අංක 7)

- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (17) සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම | | |
| 11. තිරසර සංවර්ධන අභිමතාර්ථ සාධනය උදෙසා ප්‍රාදේශීය වශයෙන් පවතින විශමතා අවම කිරීම අරමුණු කරගත් සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම | | |
| 12. ආගමන හා විගමන කටයුතු | | |
| 13. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු | | |
| 14. පුද්ගලයින් ලියාපදිංචි කිරීම | | |
| 15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

## (18) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. මහානගර හා බස්නාහිර සංවර්ධන විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනය හා රාජ්‍ය සංස්ථාවෙහි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. නාගරික සංවර්ධන අධිකාරිය | ▪ නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41) |
| 2. කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ ඒ ආශ්‍රිත කටයුතු | 2. ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | ▪ නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2) |
| 3. තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය හා ඒ ආශ්‍රිත කටයුතු | 3. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | ▪ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ පනත (1961 අංක 15) |
| 4. නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු | | ▪ කොළඹ දිස්ත්‍රික් (පහත් බිම්) ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත (1968 අංක 15) |
| 5. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ▪ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (1946 අංක 13) |
| | | ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (18) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 6. පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු | | |
| 7. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම | | |
| 8. ජාතික භෞතික සැළසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම | | |
| 9. ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කර ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදුකිරීම | | |
| 10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

## (19) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. ජාතික ඒකාබද්ධතා, සංහිඳියාව හා රාජ්‍ය භාෂා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>2. රාජ්‍ය භාෂා කොමිසම<br>3. භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය<br>4. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය | ■ රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)<br>■ රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18)<br>■ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)<br>■ ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත(1980 අංක 31)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු | | |
| 3. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම | | |
| 4. ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

## (19) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍ය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 5. ජාතික ඒකාබද්ධතාව කෙරෙහි බලපාන සම්බාධක හඳුනා ගැනීම හා අදාළ පාර්ශව සමග පැවැත්වෙන සාකච්ඡා හා කතිකා පාදක කොට ගෙන ප්‍රතිපත්තිමය වශයෙන් පියවර ගැනීම | | |
| 6. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියාකරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගැටලු ඇතොත් ඒවා සමනය කිරීම | | |
| 7. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන සහ යථාකාලයේ දී ක්‍රියාත්මක කිරීමට උචිත විවිධ උපාය මාර්ග සමාලෝචනය සහ ගැටලු නිරාකරණයට මැදිහත් වීම | | |
| 8. ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාකරනු ලබන අදාළ වැඩසටහන් හා ව්‍යපෘති අධීක්ෂණය හා ඇගයීම | | |
| 9. ඉහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය වේ නම් අරමුදල් යථායෝග්‍ය ක්‍රමවේද අනුව සෙවීම | | |
| 10. ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම | | |
| 11. ප්‍රධාන ජාතික භාෂාවන් හා සන්ධාන භාෂාව උපයෝගී කරගනිමින් ජාතීන් අතර සංස්කෘතික සමාජමය හා ආගමික පසුබිම අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම | | |
| 12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.